සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

DeÉrtment of Education - Sabaragamuwa Province

# මධ්‍යවාර පරීක්ෂණය - 2021

7 ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනය කාලය පැය 02

නම ඃ- ................................... විභාග අංකය ඃ- ......................

**සැළකිය යුතුයි.**

**I. පත්‍රයට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතුවේ.**

**II. පත්‍රයට පිළිතුරු වෙනම සපයා මෙම පත්‍රයට අමුණන්න.**

- ප්‍රශ්න අංක 11 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) පවුලක් යහපත්ව පවත්වාගෙන යාමට පවුල තුළ ............................ශක්තිමත්ව පවත්වා ගත යුතුය.

(02) ඔබ සතු උසස් ගතිගුණ, උසස් හැසිරීම් රටා හා සුවිශේෂී හැකියාවන් පිළිබඳව ඔබ ඇතිකරගන්නා හැඟීම ඔබට ............................ගෙනදෙනු ඇත.

(03) දීර්ඝ කාලයක් පැවත එන සිරිත්.විරිත්,චාරිත්‍ර ආදිය ............................ලෙස හඳුන්වයි.

(04) අපට එදිනෙදා ලැබෙන දත්ත හා තොරතුරු ............................පරිහරණය කිරීම වැදගත් වේ.

(05) ආදර්ශවත් ............................කියවීම තුලින් ඔබේ ජීවිතයට වැදගත්වන ආදර්ශ ලබා ගත හැකිය.

(සම්ප්‍රදායන්, අන්තර් සබඳතා, පොත් පත්, ආත්මාභිමානය, විචාරශීලිව, සදාචාරාත්මක)

- ‘අ’ තීරුව හා ‘ආ’ තිරුව නිවැරදිව ගලපා යා කරන්න.

| | (අ) | (ආ) |
|---|---|---|
| (06) | කාන්තා වෘත්තිකයින් විවාහ වීම | A විනිමය අනුපාත |
| (07) | රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය | B නීතිමය යුතුකමකි |
| (08) | දත්ත හා තොරතුරු | C සදාචාරාත්මක යුතුකමකි |
| (09) | දෙමාපියන්ට සැළකීම | D 1919 |
| (10) | බදු ගෙවීම | E අර්ථ සාධකය |

- ප්‍රශ්ණ අංක 11 සිට 15 දක්වා ප්‍රකාශන හරිනම් (√) ලකුණද වැරදි නම් (X) ලකුණද යොදන්න.

(11) කෙනෙකුගේ සිත තුළ ඇතිවන චිත්තවේග මුහුණේ ඉරියව් වලින් හඳුනාගත නොහැකිය. ( )

(12) සිංහල හා ඉංග්‍රීසි අප රටේ ප්‍රධාන භාෂා වේ ( )

(13) වෙළඳ සැලක මිල දර්ශනය ප්‍රදර්ශනය කිරීම අත්‍යාවශ්‍ය වේ ( )

(14) රාජකාරිය නිසිලෙස ඉටුකිරීම සදාචාරාත්මක යුතුකමකි ( )

(15) හදිසි ඇමතුම් අංකය ලෙස 119 අංකය භාවිත කරයි ( )

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(16) භාණ්ඩ වල නිශ්චිත මිල දක්වන්නේ

I. පැකැට්ටුව පිටුපසය  II. මිල දර්ශනය තුළය

III. භාණ්ඩ වලට ඉහළිනි  Iv. භාණ්ඩය මතය

(17) ඔබගේ පියාගේ අක්කා සහ ඇයගේ දුව ට ඔබ ඇමතිය යුතු ඥාතීත්ව පද පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?

I. නැන්දා/නෑනා  II. පුංචි අම්මා/නංගි හෝ අක්කා

III. ලොකු අම්මා/නෑනා  Iv. ආච්චි/දුව

(18) ආබාධ සහිත ඇමෙරිකානු ජාතික 'විල්මා රුඩොල්ෆ් ' දක්ෂතා පෙන්වූ අංශය වූයේ

I. චිත්‍ර කලාව  II. නාට්‍ය කලාව

III. ක්‍රීඩා අංශය  Iv. සංගීතය

(19) පෞද්ගලික අංශයේ සේවකයින් විශ්‍රාම ගන්වන වයස වන්නේ

I. අවු. 60
II. අවු. 55
III. අවු. 57
Iv. අවු. 65

(20) ඔබට ඇති අයිතිවාසිකමකි

I. යහපත් පුරවැසියෙකු වීම  II. අධ්‍යාපනය ලැබීම

III. බලා සහෝදරියින් රැකබලා ගැනීම  Iv. අසරණයින්ට පිහිට වීම

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.**
- **තවත් ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) I. අයහපත් චිත්තවේග 02 ක් නම් කරන්න.

II. ඔබ ප්‍රදේශයේ ඇති ස්වේච්ඡා සංවිධාන 02 ක් නම් කරන්න.

III. ඔබ අසල් වැසියන් සමග සුහදව කටයුතු කරන අවස්ථා 02 ක් නම් කරන්න.

Iv. පුද්ගලයෙකුගේ ජීව විද්‍යාත්මක අනන්‍යතාවය පෙන්විය හැකි ආකාර 02 ක් නම් කරන්න.

V. අභියෝග වලට මුහුණ දීම සඳහා ඔබ තුළ වර්ධනය කරගතයුතු ගුණාංග 02 ක් ලියන්න.

VI. ඔබට හිමි අයිතිවාසිකමක් නම්කර ඒ හා බැඳෙන යුතුකම ඉදිරියෙන් ලියන්න.

VII. පුද්ගලයා පිරිහීමට බලපාන සාධක 02 ක් නම් කරන්න.

VIII. අයිතිවාසිකම් වල ලක්ෂණ 02 ක් නම් කරන්න.

IX. ඉගෙනුම් කටයුතු වලදී ඔබට ඇති අභියෝග 02 ක් නම් කරන්න.

X. පාසලේදී ඉටුවිය යුතු ඔබේ යුතුකම් 02 ක් ලියන්න.

(ල. 2× 10= 20)

(02) I. පවුල් ඒකක වල ස්වභාවය අනුව වර්තමානයේ දැකිය හැකි පවුල් වර්ග 02 ක් නම් කරන්න. (ල. 2)

II. පවුලේ සාමාජිකයෙකු වශයෙන් ඔබ පවුලෙන් ලබන ප්‍රයෝජන 03 ක් ලියන්න (ල. 3)

III. ව්‍යාප්ත පවුලක දැකිය හැකි වාසිදායක තත්වයන් 05 ක් කෙටියෙන් දක්වන්න (ල. 3)

(03) I. යහපත් සිතුවිල වර්ධනය කිරීම සඳහා ඔබේ පාසලේ ක්‍රියාත්මක වන වැඩසටහන් 02 ක් නම් කරන්න. (ල. 2)

II. සමාජයේ යහපතට හේතුවන බලවේග 03 ක් නම් කරන්න (ල. 3)

III. අයහපත් චිත්තවේග පාලනය කර ගැනීම සඳහා අනුගමනය කළහැකි ක්‍රියාකාරකම් 05 ක් ලියන්න (ල. 3)

(04) I. වර්තමානයේ පවුලකට මුහුණපෑමට සිදුවී ඇති අභියෝග 02 ක් නම් කරන්න. (ල. 2)

II. ඔබ දන්නා අසල් වැසියන් නිරතවන විවිධ රැකියාවන් 03 ක් නම් කරන්න (ල. 3)

III. ළමා ශ්‍රමිකයින් සේවයේ යෙදවීමෙන් ඔවුන්ට ඇති විය හැකි අයහපත් බලපෑම් 05 ක් නම් කරන්න. (ල. 5)

(05) I. ඔබට එදිනෙදා දත්ත හා තොරතුරු ලැබෙන මාධ්‍ය 02 ක් නම් කරන්න. (ල. 2)

II. දෛනිකව අපට අවශ්‍ය දත්ත හා තොරතුරු වර්ග 03 ක් නම් කරන්න (ල. 3)

III. අපට දත්ත හා තොරතුරු ප්‍රයෝජනවත් වන අවස්ථා 05 ක් නම් කරන්න. (ල. 5)

(06) I. පාසලේ පවතින අන්තර් සබඳතා සඳහා උදාහරණ 02 ක් ලියන්න (ල. 2)

II. ඔබේ පවුලේ සාමාජිකයන් අන්තර් සබඳතා පවත්වන ආයතන 03 ක් ලියන්න (ල. 3)

III. ඔබ ඉහත II නම් කළ ආයතන හෝ සංවිධාන වලින් ඉටුවන සේවාවන් 05 ක් නම් කරන්න (ල. 5)

(07) I. පුද්ගලයෙකු විසින් සමාජය වෙනුවෙන් ඉටුකළ යුතු නීතිමය යුතුකම් 02 ක් ලියන් (ල. 2)

II. ඔබට පැවරෙන සදාචාරාත්මක යුතුකම් 03 ක් නම් කරන්න (ල. 3)

III. තමාට පැවරෙන අභියෝග ජය ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග 05 ක් දක්වන්න.(ල. 5)

(08) I. ඔබට ඇති ප්‍රධාන ඥාති පාර්ශව 02 නම් කරන්න. (ල. 2)

II. A තාත්තා
B පුංචි අම්මා
C ලොකු තාත්තා යන ඥාතීන් ඇමතීමට ප්‍රාදේශීය වශයෙන් භාවිතා කරන වෙනත් පද 01 බැගින් ලියන්න. (ල. 3)

III. ඥාතීන් සමඟ සබඳතා පැවැත්වීමේ ප්‍රයෝජන 05 ක් ලියන්න (ල. 5)